## පළමුවන කියැවීම

ප්‍රඥ 18:6-9a

සලමොන්ගේ ප්‍රඥාව නමැති පොතෙන් ගත් පාඨයෙකි.

**"අපේ සතුරන්ට දඬුවම් දීමට ගත් ක්‍රියා මාර්ගයෙන් ම අප ඔබ වෙත කැඳවා ගත් සේක."**

අපේ පියවරුන්ට ඒ රාත්‍රිය ගැන කල්තියා දන්වන ලදී. එබැවින් තමන් විශ්වාස කළ පොරොන්දුවල ආකාරය දුටු විට ප්‍රීතියෙන් ධෛර්යය ලබාගත්තෝ ය. ඔබේ ජනතාවගේ බලාපොරොත්තුව වූයේ දැහැමියන්ගේ ගැළවීමත් සතුරන්ගේ විනාශයත් ය. ඔබ අපේ සතුරන්ට දඬුවම් දීමට ගත් ක්‍රියා මාර්ගයෙන් ම අප ඔබ වෙත කැඳවාගැනීමෙන් ඔබ අප මහිමාන්විත කළ සේක. දැහැමි අයගේ බැතිමත් දරුවෝ රහසින් පඬුරු ඔප්පු කළහ. එබැවින් මේ දිව්‍යමය ගිවිසුමට ඔව්හු ඒකමතිකව එකඟ වූහ.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 33:1, 12, 18-20, 22

පිළිතුර: සමිඳාණෝ තෝරා ගත් සෙනඟ ආසිරි ලද්දෝ ය.

ගීය: දැමිටුනි, හිමි තුමන් කෙරේ ප්‍රීති සන්තෝෂ වන්න. ප්‍රශංසාව අවංක අයට හොබනා දෙයකි. සමිඳුන් තමන් දෙවියන් කොට සලකන ජාතිය ද දෙවිඳුන් සතු උරුමය ලෙස තේරුණු සෙනඟ ද ආසිරි ලද්දෝ ය.

දේව භය ඇත්තෙනි, දේව කරුණාව පතන්න; මරණයෙන් ගළවන පිණිස ද දුබික් දුරු කොට දිවි රක්නා පිණිස ද එතුමාණෝ දිවැසින් බලන සේක. අපි හිමි තුමන් කෙරේ විශ්වාසයෙන් බලා සිටියෙමු.

අපේ පිහිටත්, පලිහත් එතුමාණෝ ය. සමිඳුනි, ඔබ කෙරේ අපේ බලාපොරොත්තු පිහිටෙවු ලෙස ම ඔබේ කරුණාව අප කෙරෙහි වේ වා!

## දෙවන කියැවීම

හෙබ්‍රෙව් 11:1-2, 8-19

හෙබ්‍රෙව් වරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**"ආබ්‍රහම් බලාපොරොත්තු වූයේ දෙවියන් වහන්සේ ට, සාදා නිම කළ නගරයෙකි."**

ඇදහිල්ල වනාහි බලාපොරොත්තු වන දේ පිළිබඳ සහතිකය වේ. අදෘශ්‍යමාන දේ පිළිබඳ පැහැදීම ය. තමන්ගේ ඇදහිල්ල නිසා අපේ මුතුන්මිත්තෝ දෙවියන් වහන්සේට ප්‍රිය මනාප වූ හ. ඇදහිල්ලෙන්, ආබ්‍රහම් කැඳවීම ලැබූ කල, තමා යන්නේ කොහේ ද යි නොදැන, තමාට උරුමයක් ලෙස පසු ව ලැබෙන්නට යන ස්ථානයකට පිටත් ව යන ලෙස කීකරු වී, නික්ම ගියේ ය. ඇදහිල්ලෙන්, ඔහු විදේශිකයෙකු මෙන් දෙවියන් වහන්සේ පොරොන්දු වූ දේශයෙහි පදිංචි වී, එම පොරොන්දුවට හිමිකාරයන් වූ ඊසාක් සහ ජාකොබ් සමඟ කුඩාරම්වල වාසය කෙළේ ය. මන්ද, දෙවියන් වහන්සේ ම, සිය සැලැස්ම අනුව සාදා නිම කළ සවි අත්තිවාරම් ඇති, නගරය ගැන ඔහු බලා සිටියේ ය. ඇදහිල්ලෙන්, සාරා පොරොන්දුව දුන් තැනැන් වහන්සේ විශ්වාස කටයුතු කෙනෙකැ යි පිළිගත් නිසා, නිසි වයස පසු වුව ද පිළිසිඳගැනීමේ ශක්තිය ලැබුවා ය. එහෙයින් මළ කෙනෙකු වැනි තැනැත්තෙකුගෙන් පවා, ගණනින් අහසේ තරු මෙන් ද, මුහුදු වෙරළේ අසංඛ්‍ය වැලි ඇට මෙන් ද වූ විශාල පරපුරක් ඇති විය. (ඇදහිල්ලෙහි පිහිටා සිටි මොවුහු

සියල්ලෝ ම මියගිය හ. ඔව්හු පොරොන්දු වූ දේ නොලැබූ නමුත්, ඒවා කල්තියා දැක සතුටින් පිළිගෙන, මිහි පිට තමන් විදේශීන් ද ආගන්තුකයන් ද බව ප්‍රකාශ කළහ. මෙබඳු දේ ප්‍රකාශ කරන අය, තමන්ගේ ම මවුබිමක් සොයන බව මැනවින් පැහැදිළි කරති. ඔව්හු තමන් හැරදමා ආ රට ගැන ම සිත සිතා සිටියහු නම්, පෙරළා එහි යාමට ඔවුන්ට අවස්ථා තිබිණි. එහෙත් ඔව්හු දැන් වඩා උතුම් රටක්, එනම් ස්වර්ගීය රටක් දෙස සිත් යොමු කරති. දෙවියන් වහන්සේ ඔවුන්ගේ දෙවිඳුණෝ යයි කියනු ලබනවාට උන් වහන්සේ ලජ්ජා නොවන්නේ උන් වහන්සේ ඔවුන්ට නුවරක් පිළියෙළ කර තිබෙන නිසා ය. ආබ්‍රහම් පරීක්ෂා කරනු ලැබූ කල, ඔහු ඇදහිල්ලෙන් ඊසාක් පූජා කෙළේ ය. "ඔබේ වංශය ඊසාක්ගෙන් පැවත එන්නේ ය" යන දේව පොරොන්දුව ආබ්‍රහම් සතුටින් පිළිගත් නමුත්, සිය ඒකජාතක පුත්‍රයා පූජා කිරීමට සූදානම් ව සිටියේ ය. මළවුන් උත්ථාන කිරීමට වුව ද දෙවියන් වහන්සේට හැකි බව ඔහු සිතට ගෙන, එක් විදියකට කියතොත්, ඔහු ඊසාක් මරණයෙන් නැවත ලබාගත්තේ ය.)

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** මතෙව් 24:42

ආලේලූයා! ආලේලූයා!
'අවදිව ඉන්න ඔබගේ සමිඳාණෝ කිනම් දවසක එන සේක් දැ යි
ඔබ නොදන්නහු ය'යි ස්වාමින් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ලූක් 12:32-48

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"ඔබ ද අවදි ව සිටින්න."**

("කුඩා රැළ, බිය නොවන්න, ඔබට රාජ්‍යය දෙන්නට ඔබගේ පියාණන් වහන්සේ සැදී පැහැදී සිටින සේක. ඔබ සතුදේ විකුණා දන් දෙන්න; නොදිරන පසුම්බි ද නොපිරිහෙන වස්තු ද ස්වර්ගයෙහි ඔබට සපයාගන්න. එහි දී ඒවාට සොරු ළං නොවෙති, කාවෝ ද නාස්ති නොකරති. මන්ද, ඔබගේ වස්තුව කොතැන ද, ඔබගේ සිතත් එතැන ම ය.") "ඔබගේ ඉඟ පටි බැඳගන්න, පහන් ද දල්වා තබාගන්න. තම ස්වාමියා සරණ මංගල්‍යයෙන් පසු, පෙරළා අවුත් දොරට තට්ටු කළ වහා ම දොර හරිනු වස් ඔහුගේ ඊම බල බලා සිටින මනුෂ්‍යයන් හා සමාන ව සිටින්න. ස්වාමියා එන කල දාසයන් අවදි ව සිටිනු ඔහු දුටුවොත් ඒ දාසයෝ භාග්‍යවන්තයෝ ය. ඇත්තෙන් ම මම ඔබට කියමි, ඔහු තමාගේ ඉඟ පටිය බැඳ ඔවුන් කෑමට හිඳුවා ඔවුන්ට උපස්ථාන කරන්නේ ය. ඔහු දෙ වන යාමයේ දී හෝ තුන් වන යාමයේ දී හෝ අවුත් එලෙස ම දකින්නේ නම් ඒ දාසයෝ භාග්‍යවන්තයෝ ය. එහෙත්, සොරා කොයි පැයේ දී එන්නේ දැ යි ගෙදර ස්වාමියා දැන සිටියේ නම්, ඔහු නොනිදා හිඳ, තමාගේ ගෙය බිඳීමට ඉඩ නොදෙන බව දැනගන්න. එබැවින් ඔබත් සූදානම් ව සිටින්න. මෙසේ කියන්නේ, ඔබ බලාපොරොත්තු නොවන පැයක දී මනුෂ්‍ය-පුත්‍රයාණන් වඩින නිසා ය." (එවිට පේදුරු කතා කරමින්, "ස්වාමීනි, මේ උපමාව වදරන්නේ අප උදෙසා ද, නැතහොත් සියල්ලන් උදෙසා දැ"යි උන් වහන්සේගෙන් ඇසී ය. එවිට සමිඳාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේක: "ඉදින් ස්වාමියා විසින් තම ගෙයි වැසියන්ට නියම වේලාවට ආහාර කොටස සපයන පිණිස ඔවුන්

කෙරේ පත් කරනු ලබන විශ්වාසී, සිහි නුවණ ඇති ගබඩාකාරයා කවරෙක් ද? ස්වාමියා ආ කල යම් දාසයකු සිය සේවයෙහි සිටිනු ඔහු දුටුවොත් ඒ දාසයා භාග්‍යවන්තයෙක් ය. ඒ ස්වාමියා තමා සන්තක සියල්ල කෙරෙහි ඔහු පත් කරන්නේ යයි ඇත්තෙන් ම මම කියමි. එහෙත් ඒ දාසයා, 'මාගේ ස්වාමියාගේ ඊම පමාවනු ඇතැ'යි සිතමින් දාසිදාසුන්ට පහර දෙන්නටත් කා බී මත් වන්නටත් පටන් ගතහොත්, ඔහු බලාපොරොත්තු නොවන දිනක දී, නොදන්නා පැයක දී ඒ දාසයාගේ ස්වාමියා අවුත් ඔහුට දරුණු ලෙස දඬුවම් කොට, අවිශ්වාසීන්ට නියම ඉරණම ඔහුටත් නියම කරන්නේ ය. සිය ස්වාමියාගේ අදහස දැනගෙනත්, ඒ අදහස පරිදි කටයුතු සංවිධානය නොකළාවූ ද ක්‍රියා නොකළාවූ ද දාසයා බොහෝ පහර ලබන්නේ ය. එහෙත් ඒ අදහස නොදැන, පහර ලැබීමට නිසි දේ කළ අය ස්වල්ප වශයෙන් පහර ලබන්නෝ ය. යමෙකුට බොහෝ දේ දෙන ලද්දේ ද, ඔහුගෙන් බොහෝ දේ බලාපොරොත්තු වනු ලැබේ; යමෙකුට බොහෝ දේ පවරන ලද්දේ ද, ඔහුගෙන් ඊටත් වැඩියෙන් බලාපොරොත්තු වනු ලැබේ.")

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.